**ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය - 2019**

**--------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**------------------**

**1.1** විගණනය කළ මතය

**--------------------------**

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය,හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මම මතයක් ප්‍රකාශ නොකරමි.

**1.2 විගණනය කළ මතය සඳහා පදනම**

--------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය විගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ විගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව,මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත්,සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ දින 322 ක් ප්‍රමාද වී 2021 පෙබරවාරි 23 දිනදීය. | ශ්‍රී ලං.ග.ම. අවසන් ගිණුම් සකස් කිරීම වර්ෂ ගණනාවක් ප්‍රමාදව පැවති අතර, මේ වන විට එකී තත්වය මහ හරවා ගනිමින් 2020 වර්ෂය දක්වාම අවසන් ගිණුම් සකස් කර විගණනය සඳහා ලබා දී ඇත. කෙසේ නමුත් 2018 වර්ෂයේදී මූල්‍ය අංශයේ කටයුතු නව ගිණුම්කරණ පැකේජයක් හඳුන්වා දීම මත 2018 හා 2019 වර්ෂ වල අවසන් ගිණුම් කටයුතු යම්තාක් දුරට ප්‍රමාද විය. ඊට හේතුව වන්නේ එහි මූලික කටයුතු සහ සේවක පුහුණු කිරීම් ආදිය සිදු කරමින් එහි අඩු පාඩු සකස් කරමින් ගිණුම් කටයුතු සිදු කිරීම නිසා වේ. | චක්‍රලේඛයට අනුව නියමිත දිනට අවසන් ගිණුම් විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)<br>(i)මණ්ඩලය සතු ස්ථාවර තැන්පතු වටිනාකම රු 628,678,099.ක්වූ අතර, ස්ථාවර අයිරා පහසුකමක්ද මහජන බැංකුව වෙතින් සලසා ගෙන | ශ්‍රී ලංගම සතු ස්ථාවර තැන්පතුව ඇපයක් ලෙස තබා ස්ථාවර අයිරා පහසුකමක් ලබා ගෙන ඇත. SLFRS (7) 14 ඒ අනුව වගකීම් සහ | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිත අංක 07හි (SLFRS 7) 14 ඒ |

| | | |
|---|---|---|
| තිබුණි .මේ සඳහා රු.325,100,000 ක ස්ථාවර තැන්පතු ,ඇප සුරැකුමක් ලෙස ඉදිරිපත් කර තිබුණු අතර ,ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිත අංක 07හි (SLFRS 7) 14 ඒ හා බී වගන්ති ප්‍රකාරව අනාවරණය කර නොතිබුණි. | අසම්භාව්‍ය වගකීම් පමණක් අනාවරණය කළ යුතු බව දක්වා ඇති අතර, මෙය වගකීමක් හෝ අසම්භාව්‍ය වගකීමක් නොවන බැවින් අනාවරණය කිරීම අවශ්‍ය නොවේ. | හා බී වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ii)ප්‍රමිත අංක 16 අනුව වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නොතිබුණු අතර ප්‍රමිතයේ 58 ඡේදය ප්‍රකාරව, ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම වෙන් වෙන්ව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වුවද එසේ කර නොතිබුණි. | ශ්‍රී ලං.ග.ම. ගිණුම්කරණ ප්‍රතිපත්ති තුළ වත්කම් පිරිවැය යටතේ පවත්වාගෙන යන බව ගිණුම්කරණ ප්‍රමිත අංක 16 අනුව පිරිවැය ක්‍රමය හෝ ප්‍රත්‍යාගණන ක්‍රමය යටතේ වත්කම් වල අගයන් පවත්වාගෙන යා හැකිය. ඒ අනුව මෙම වත්කම් සියල්ල ප්‍රත්‍යාගණන කිරීම අවශ්‍ය නැත. | ගිණුම්කරණ ප්‍රමිත අංක 16 අනුව කටයුතු කළයුතු වේ. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

---------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ජපන් ජාත්‍යන්තර සහයෝගිතා වැඩ පිළිවෙල යටතේ 2019/2020 වසර තුළදී රු.426,390,078 ක් වටිනා යන්ත්‍රෝපකරණ මණ්ඩලයට ලැබී තිබුණි. මෙම යන්ත්‍රෝපකරණ අතුරින් රු.189,343,036ක් වටිනා අයිතම 90 ක් 2019 වර්ෂයේදී ලැබී තිබුණු ඒවා වූ අතර,එම යන්ත්‍ර සමාලෝචිත වර්ෂයේ යන්ත්‍රෝපකරණ ගිණුමට හර කර ප්‍රාග්ධනය ප්‍රදාන ගිණුම බැර කිරීමට කටයුතු කර නොතිබුණි.<br>මෙම වත්කම් රේගුවෙන් නිදහස් කර ගැනීම සඳහා රේගු ගාස්තු වශයෙන් රු.38,663,394 ක මුදලක් ගෙවා තිබුණි. මෙම වටිනාකම ප්‍රාග්ධනිත කර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16ට පටහැනිව රු.322,194 ක් ක්ෂය කර තිබුණි. ඒ අනුව ක්ෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් ගිණුම්වල දක්වා තිබුණි. | යම් වත්කමක් ප්‍රාග්ධනිත කිරීමට නම් ඊට අවශ්‍ය වටිනාකම් හඳුනාගැනීම සඳහා අවශ්‍ය ලේඛනයන් ලැබී තිබිය යුතුවේ. මෙම යන්ත්‍රෝපකරණ ප්‍රාග්ධනිත කිරීමට ප්‍රමාණවත් ලේඛනයන් අදාල අංශ විසින් 2019 වර්ෂය තුළ ලබා දී නොතිබුණි. එබැවින් එම යන්ත්‍රෝපකරණ සමාලෝචිත වර්ෂය තුළ ප්‍රාග්ධනිත කර නොමැත. | වත්කම් නිවැරදිව ප්‍රාග්ධනිත කළයුතු වේ. |
| (ආ)ඉන්ධන පිරවුම්හල් හා රියදුරු පුහුණු පාසල් වෙළඳ ණයහිමි ගිණුමේ රු.26,376,043 ක හර ශේෂයක් දැක්වුණි. ඒ අනුව එම ප්‍රමාණයෙන් ණයහිමි ශේෂය අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මෙහි දක්වා ඇති රු.22,776,043 ක ශේෂය ඉන්ධන පිරවුම්හලට අදාල වේ. මෙය සතියක අවශ්‍යතාවය සඳහා ඉන්ධන ලබාගැනීම වෙනුවෙන් නිකුත් කරන චෙක්පත් වටිනාකම වේ. | නිවැරදි ශේෂය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුවේ. |

| | | |
|---|---|---|
| | මෙහි රියදුරු අභ්‍යාස විද්‍යාලයන්ට අදාල අගය රු.3,600,000 ක් වේ. | |
| (ඇ)අත්තිකාරම් යටතේ රු. 1,828,207ක බැර ශේෂයක් දක්වා තිබීම නිසා අත්තිකාරම් ගිණුම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම දෝෂය සිදු වී ඇත. එහි වටිනාකම රු.1,691,932 ක් ලෙස නිවැරදි විය යුතු අතර, මෙය කළුතර ප්‍රාදේශිකය තුළ වන ඩිපෝවන් අතුරින් පානදුර රු.351,207 ක්ද, අළුත්ගම රු.414,795 ක්ද, මතුගම රු.427,469 ක්ද හොරණ රු.498,460 ක්ද වශයෙන් වේ. එම ඩිපෝවන් විසින් නිලධාරීන් වෙත අත්තිකාරම් ලබාදීමට ප්‍රථම ලබාදෙන අත්තිකාරම් මුදල් සේවක වැටුපෙන් අය කරගෙන ඇත. | වැටුප් අත්තිකාරම් නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. |
| (ඈ)වටිනාකම රු 15,771,334.ක රඳවාගත් තැන්පතු මුදල් කෙරීගෙන යන වැඩ ගිණුමට හර කිරීම නිසා කෙරීගෙන යන වැඩ ගිණුම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | ගිණුම් තැබීමේදී මෙම දෝෂය සිදු වී ඇත. | ගිණුම්ගත කිරීම නිවැරදිව සිදුකළ යුතුවේ. |
| (ඉ)මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී ලීසිං ක්‍රමයට බස් රථ 325ක් ලබාගෙන තිබූ අතර ,ඒ සඳහා ගෙවූ රු 263,435,339. ක මූලික ගෙවීම (Down Payment) ඉදිරි ගෙවීම් යටතේ දක්වා තිබුණි. | මෙම මූලික ගෙවීම අවසන් වාරිකය සඳහා හිලව් කිරීම සාමාන්‍ය ක්‍රමවේදය වේ. ඒ අනුව මෙම මුදල ණය වාරික වලින් අඩුකළ හොත් ගෙවිය යුතු වාරික ගණන අඩුවෙන් පෙන්වනු ලබයි. එබැවින් අත්තිකාරම් ගිණුමේ පෙන්වා ඇත. | මූලික ගෙවීම නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඊ)වටිනාකම රු 4,089,000.ක් වූ විගණන ගාස්තු වියදම මෙහෙයුම් වියදම් වර්ගීකරණය යටතේ ඇති වෙනත් වියදම් ගිණුමට ඇතුළත් කර ගිණුම්ගත කර තිබුණි. | අදාල දෝෂය සිදු වී ඇත. | වියදම් වර්ගීකරණය නිවැරදිව කළ යුතුවේ. |
| (උ)මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම ගිණුම් 6 කට අදාළ මුදල් පොත්වල ශේෂය අඩුවෙන් හා වැඩියෙන් දැක්වීම නිසා රු. 32,663,359 ක ශේෂයක් අඩුවෙන් දක්වා තිබුණි. | ශ්‍රී ලං.ග.ම. විසින් මූල්‍ය ප්‍රකාශ සකස් කරනු ලබන්නේ ගිණුම්කරණ පද්ධතියක් මඟිනි. එහිදී යම් ගනුදෙනුවක් වන අවස්ථාවේදීම මෙම ගිණුම්කරණ පද්ධතියට එය ඇතුළත් කරනු ලබයි.<br>නමුත් මුදල් පොත් පිළියෙල කිරීමේදී එම ගනුදෙනුව සිදුවන අවස්ථාවේදීම අදාල දත්තයන් ඊට ඇතුළත් නොකරන බැවින් (ආදායම් උපලබ්ධි වූ පසුව ඇතුළත් | මුදල් පොත නිවැරදිව පිළියෙල කළ යුතුවේ. |

| | | |
|---|---|---|
| | කරන බැවින්) මූල්‍ය ප්‍රකාශනයේ ශේෂය හා මුදල් පොත්හි ශේෂයන්හි වෙනසක් ඇති වේ. | |
| (ඌ)බැංකු ගිණුමකට අදාළව 2019 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබූ බැංකු සැසඳුමට අනුව රු 22,385,852.ක වාසිදායක ශේෂයක් පෙන්නුම් කළද මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් නොකිරීමෙන් මුදල් ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 014-1001-6-0003586 දරන ජංගම ගිණුම රත්මලාන ඉන්ධන පිරවුම්හලට අදාල ගිණුමකි. ගිණුම්කරණ පැකේජය තුළ එය ඉන්ධන පිරවුම්හල් නමින් වෙනම ඒකකයක් ලෙස පවතී. මෙම බැංකු ශේෂය එම ඒකකය තුළ සඳහන්වේ. | මූල්‍ය ප්‍රකාශනවල බැංකු ගිණුම් ශේෂය නිවැරදිව ඉදිරිපත් කළයුතු වේ. |
| (එ)මණ්ඩලයට අයත් වේරහැර පිහිටි ඉඩමක් කොතලාවල ආරක්ෂක පීඨයට පැවරීම වෙනුවෙන් මහා භාණ්ඩාගාරයෙන් 2018 වර්ෂයෙන් ලද ර 2,000,000,000 හා සමාලෝචිත වර්ෂයේ ලද රු. 2,054,000,000වශයෙන් රු 4,054,000,000.ක මුදල නිවැරදි ලෙස ගිණුම්ගත නොකොට අනෙකුත් ගෙවිය යුතු ශේෂ යටතේ දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂයේ ලද මුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබුණි. | මෙම මුදල මුදල් ප්රවාහය තුළ ආයෝජනය ක්‍රියාකාරකම් තුළ ඇතුළත් කර නැත. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය නිවැරදිව පිළියෙල කළ යුතුවේ. |

**1.5.4 අවිනිශ්චිත ගිණුම්**

-------------------------

| විෂය | මුදල | අවිනිශ්චිත ලෙස තිබූ කාලය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ)සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු 967,187.ක අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය ගිණුම් වර්ෂය අවසානයට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | රු.967,187 | වසර 01 | මෙම ශේෂයන් පෙර සිට පැවත එන ශේෂයන් වන අතර එය මහරගම රු.23,312.08ක් හා අවිස්සාවේල්ල රු.23,312 ක බැර ශේෂයන්ද මාවනැල්ල ඩිපෝවේ රු.72,984,142ක හර ශේෂයක්ද වේ. මඩකලපුව ඩිපෝව විසින් ආදායම් අවිනිශ්චිත ගිණුමට අදාල ශේෂයක් වන රු.545,308ක වටිනාකම වැරදීමකින් අවිනිශ්චිත ගිණුමට බැර කර ඇත. | අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. |

එමෙන්ම මොණරාගල ඩිපෝව මඟින් රු.60,000ක අගයක් අවිනිශ්චිත ගිණුමට බැර වී ඇත්තේ ගිණුම්කරන දෝෂයක් හේතුවෙනි.

### 1.5.5 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල භාණ්ඩාගාර ප්‍රදාන ගැලපීමට පෙර අඛණ්ඩව අලාභ තත්ත්වයක පවතින අතර තව දුරටත් රජයෙන් ලැබෙන ප්‍රදාන නොලැබුණහොත් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රශ්ණ සහගත තත්ත්වයක් පවතී. | අදහස් දක්වා නොමැත. | අඛණ්ඩ පැවැත්ම පිළිබඳ අදාල හෙළිදරව් කිරීම් කළයුතුවේ. |

### 1.5.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ)මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන අක්‍රීය ගිණුම් හර ශේෂ | රු. 1,290,782,781 | අදාළ විගණන සාක්ෂි කිසිවක් විගණනයට නොලැබුණි. | අදාල දෝෂය සිදු වී ඇත. | විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි සැපයීමට කටයුතු කළ යුතුයි. |
| (ආ)මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන අක්‍රීය ගිණුම් බැර ශේෂ | රු.18,526,264,783 | අදාළ විගණන සාක්ෂි කිසිවක් විගණනයට නොලැබුණි | අදාල දෝෂය සිදු වී ඇත. | විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි සැපයීමට කටයුතු කළ යුතුයි. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානය වන විට කොන්දොස්තරවරුන්ගෙන් අයවිය යුතු මුදල රු 1,082,800.ක් වූ අතර , ඉන් රු 825,008.ක් වසර 10කට වැඩි කාලයක සිට අය නොවී පැවතුණි. | මෙම රු.825,008 ක වටිනාකම පෙර සිට පැවත එන අගයන් වේ. මෙම ශේෂයන්ගෙන් අයකර ගත හැකි ශේෂයන් අයකර ගැනීමටත්, ඉතිරි ශේෂයන් පිළිබඳ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා පියවර ගෙන ඇත. | අදාල හිඟමුදල් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වසර 10 කට වඩා කල් ඉකුත් වූ රු. 673,709,857 ක ණයහිමි ශේෂ විධිමත් අධ්‍යයනකින් පසු කපා හැරීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම රු.673,709,857 ක වටිනාකම පෙර සිට පැවත එන අගයන් වේ. මෙම ශේෂයන් සත්‍ය වශයෙන්ම ගෙවීම් කිරීමට තිබේද නැද්ද යන්න සොයා බලා ගෙවීම් කළයුතු නම් ඒ සම්බන්ධවද, ගෙවීම් කිරීමට නොමැති නම් එනම් ගිණුම්කරණ දෝෂයක් වේ නම් ඒ පිළිබඳව වාර්තාවක් ලබාදෙන ලෙස සියලු ප්‍රාදේශිකයන් වෙත දැනුම් දී ඇත. ඒ අනුව ඉදිරි ගැලපීම් සිදු කර මෙම අගය නිවැරදි කරනු ඇත. | ණයහිමි ශේෂ නිසිපරිදි නිවැරදි කළයුතු වේ. |
| (ආ)සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා දායක මුදල් නියමිත දිනට නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31දිනට රු 9,099,049.ක ගෙවිය යුතු ශේෂයක් විය. | ශ්‍රී ලං.ග.ම. අර්ථසාධක අරමුදල සඳහා හිමිකම් කියන්නාවූ මෙතෙක් හඳුනා නොගත් සාමාජිකයින්ගේ දායක මුදලින් ඉල්ලීම් නොකළ ප්‍රතිලාභ මුදල් පමණක් මේ වන විට ගෙවීම් කිරීමට ඇත. එම සාමාජිකයින් විසින් අදාල ප්‍රතිලාභ මුදල් ඉල්ලීම් කරනු ලබන ආකාරය අනුව ඔවුන් වෙත ගෙවීම් කරමින් පවතී. එමෙන්ම හිඟව තිබූ සියළුම අර්ථසාධක අරමුදල් හා භාරකාර අරමුදල් මෙහි ඇති වටිනාකම් ගිණුම්කරණ දෝෂයක් නිසා සිදුවී ඇත. | දායක මුදල් නියමිත දිනට ගෙවීම් කළයුතු වේ. |

### 1.6.3 අත්තිකාරම්

-----------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)නිලධාරින්ට ලබාදී ඇති වැටුප් අත්තිකාරම් ඊලග මස වැටුපෙන් අයකර ගැනීම ආරම්භ කළ යුතු වුවත්,2019 දෙසැම්බර් 31 වන දිනට අයකර ගතයුතු මුළු මුදල රු.283,905,777 ක් විය.එම ශේෂයෙන් රු.4,751,012 ක වටිනාකම වසර 10 කට වැඩි කාලයක සිට අයනොවී පැවතුණි. | වර්ෂ 10 කට වඩා වැඩි ශේෂයන් තුළ පෙර සිට පැවත එන අගයන් ඇතුළත්ව ඇත. එම අගයන් නිවැරදිව හඳුනාගැනීමෙන් පසුව නිලධාරීන්ගෙන් අයකර ගත හැකි ශේෂයන් අයකර ගැනීමටත්, එසේ අය කර ගැනීමට නොහැකි ශේෂයක් වෙතොත් ඒ පිළිබඳ වාර්තාවන් ලබාගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා කටයුතු කරනු ඇත. | වැටුප් අත්තිකාරම් නිසි පරිදි අයකර ගත යුතුවේ. |
| (ආ)මිලදී ගැනීම් සහ අනෙකුත් අවශ්‍යතා සඳහා නිලධාරින්ට ලබාදෙන අත්තිකාරම් ඔවුන් විසින් දින 30ක් ඇතුළත නිරවුල් කල යුතු වුවද, රු 1,511,740,472.ක වටිනා අත්තිකාරම් වසර 01 සිට 10දක්වා කාලයක් තුල අයකර ගෙන නොතිබුණි. | 1.6.3 (අ) හා (ඇ) මඟින් මීට අදාළ පිළිතුරු ලබාදී ඇත. | අත්තිකාරම් නියමිත දිනට පියවිය යුතුවේ. |
| (ඇ)එකතු වටිනාකම රු.1,509,222,479 ක් වූ දේශීය මිලදී ගැනීම් අත්තිකාරම්, අනෙකුත් අත්තිකාරම්, ශ්‍රී ලංගම අත්තිකාරම්හි විශේෂ අත්තිකාරම් වසර 05 කට අධික කාලයක සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | විශේෂ අත්තිකාරම් සහ අනෙකුත් අත්තිකාරම් යටතේ දක්වා ඇති අගයන් ශ්‍රී ලං.ග.ම. නිලධාරීන්ගේ වැටුපෙන් අඩු කරගැනීමේ පදනම මත ලබාදුන් අත්තිකාරම් වේ. එම අත්තිකාරම් ශේෂයන් පෙර සිට පැවත එන ශේෂයන් වන බැවින් නිශ්චිතව හඳුනා ගැනීමෙන් පසුව එම ශේෂයන් අදාල නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරනු ඇත. එසේ අය කර ගැනීමට නොහැකි ශේෂයක් වෙතොත් ඒ පිළිබඳ වාර්තාවන් ලබාගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා කටයුතු කරනු ඇත. | අත්තිකාරම් නියමිත දිනට පියවිය යුතුවේ. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

---------------------------------------------------------------------------------

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ)2018 සැප්තැම්බර් 18 දිනැති පීඑ්ඩී 2018/01 චක්‍රලේඛය | මණ්ඩලය විසින් වාහන බදු පදනම මත ලබාගත යුතු වුවද ,සිදු කල නියැදි විගණනයේ දී වාහන 20 ක් මණ්ඩලයෙහි සේවය කරන නිලධාරීන් සතු වාහන බවත් ,එම වාහන අදාළ සමාගම හරහා මණ්ඩලයට ලබාදී අදාල නිලධාරීන් විසින් භාවිතා කිරීම සිදු වන බවත් ඒ තුලින් මණ්ඩලයෙහි මුදල් අවභාවිත කිරීමක් සිදු කරන බවත් වැඩි දුරටත් නිරීක්ෂණය විය. | 2018 වර්ෂය වන විට ශ්‍රී ලංගමය වෙත වාහන බදු කුලී පදනම මත ලබා ගැනීමට කටයුතු කර තිබුණි. එසේ වුවද 2021.12.31න් පසු කිසිදු වාහනයක් කුලී පදනම මත ලබා ගැනීමේ කටයුතු සිදු නොකරන අතර දැනට කුලී පදනම මත ලබා ගත් වාහනද ඉවත් කිරීමට කටයුතු සිදු කරමින් පවතී. | අදාල චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතුය. |
| (ආ)ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 1979 අංක 5 දරන චක්‍රලේඛය | වර්ෂයකට පඩි රහිත නිවාඩු 07-01 දක්වා 14-07දක්වා හා 27-15 දක්වා ලබා ගන්නා සේවකයින් රු1., ,000රු.2, 000හා රු.3, 000 ක දඩයකට යටත් කර ඇති අතර ඊට අමතර කිසිඳු විනය ක්‍රියා මාර්ගයක් නොගැනීම නිසා සේවකයින් දිගින් දිගටම පඩි රහිත නිවාඩු ලබා ගන්නා බව නිරීක්ෂණය විය .මේ සම්බන්ධව ආයතන සංග්‍රහය අනුවද කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංගම විනය ව්‍යවස්ථා මාලාව අනුව මේ වන විට විනය ක්‍රියාමාර්ග ගැනීම සිදු කරනු ලබයි. මෙහි පවතින අඩුපාඩු පිළිබඳව මාගේ අවධානයට ලක් වුනි. | විනය ව්‍යවස්ථා මාලාව අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා මුදල් රෙගුලාසි සංග්‍රහයේ (i) 105 වගන්තිය | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010 ජුනි 25දින ගෙන ඇති තීරණය අනුව අලාභ සම්බන්ධව අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගත හැකි උපරිම මුදල රු. 20,000කට සීමා වීම නිසා මණ්ඩලයට අය විය යුතු විශාල මුදලක් අයකර ගැනීමට නොහැකි තත්තවයක් උද්ගතව තිබුණි. | මෙම තීරණය ශ්‍රී ලං.ග.ම. අධ්‍යාක්‍ෂක මණ්ඩලය මගින් ගෙන තිබූ තීරණයක් වන අතර මේ වන විට මෙම මුදල රු.ලක්‍ෂය දක්වා වැඩි කර ඇත. | ශ්‍රී ලංකා මුදල් රෙගුලාසි සංග්‍රහයේ 105 වගන්තියට අනුව කටයුතු කළ යුතුවේ. |
| (ii) මුදල් රෙගුලාසි 110 | මණ්ඩලය විසින් හානි පිළිබඳ වාර්තා කිරීමට ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | මණ්ඩලය විසින් හානි පිළිබඳ වාර්තා ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. එසේ වුවද මේ වන විට සියලු සේවා ස්ථානයන්හි හානි ලේඛනයක් පවත්වා ගැනීමට උපදෙස් ලබා දී ඇත. | මුදල් රෙගුලාසි 110 ට අනුව කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (iii) මුදල් රෙගුලාසි 381 | රාජකාරි බැංකු ගිණුම් ආරම්භ කිරීමේදී භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කල යුතු වුවත්, එසේ භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට මණ්ඩලය විසින් බැංකු ජංගම ගිණුම් 18 ක් ක්‍රියාත්මක කර තිබුණි. | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ශ්‍රී ලං.ග.ම. ප්‍රධාන කාර්යාලය තුළ ජංගම ගිණුම් 13 ක් පවත්වාගෙන යන ලදී. එකී ජංගම ගිණුම් බොහෝ කාලයකට පෙර ආරම්භ කර ඇති අතර, එම කාල වකවානු වලදී අදාල ගිණුම් විවෘත කිරීම සඳහා අනුමැති ලබා ගත්තේද යන්න නිශ්චිත නොවූ බැවින්, මෙම ගිණුම් අතුරින් අත්‍යාවශ්‍ය බැංකු ගිණුම් පමණක් පවත්වාගෙන යාම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. | මුදල් රෙගුලාසි 381 ට අනුව කටයුතු කළ යුතුවේ. |
| (iv) මුදල් රෙගුලාසි 387 | චෙක්පත් මගින් කරන සියලු ගෙවීම් සඳහා තම බැංකු ශේෂය ප්‍රමාණවත් බවට ගෙවීම් කරන නිලධාරියා සැලකිලිමත් විය යුතු අතර කිසිම ආණ්ඩුවේ බැංකු ගිණුමකින් අයිරා පහසුකම් ලබා ගැනීම තහනම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානයට මණ්ඩලයේ රු 239,443,555.ක බැංකු අයිරාවක් විය. ඒ සඳහා පොළිය ලෙස රු.963,717 ක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණි. | මෙම වර්තාකමින් බොහෝවිට පෙන්නුම් කරනුයේ මුදල් පොතට අනුව අයිරාව වන අතර, බැංකු ප්‍රකාශනය අනුව අයිරා පහසුකම් ලබාගෙන ඇත්තේ ඉතා සීමිත ඩිපෝ ගණනක් පමණි.<br>මින් ඉදිරියට මුදල් පොත අනුව අයිරා තත්ත්වයක් ඇති නොවේ. | මුදල් රෙගුලාසි 387 ට අනුව කටයුතු කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-----------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,889,833,960 ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.1,285,969,923 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.603,864,037 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පරිපාලන වියදම් රු. 1,242,405,147 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

--------------------------------------------------------------------

- සමාලෝචිත වර්ෂයේදී ඉකුත් වර්ෂයට සාපේක්ෂව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ආදායම් තුළ ඇතුළත් විශේෂ හමුදා කුලී ආදායම්, ඉන්ධන විකුණුම් ආදායම් සහ ඉවතලන ඉන්ධන විකුණුම් ආදායම් පිළිවෙලින් සියයට 54 කින්, සියයට 60 කින් හා සියයට 64 කින් අඩුවී ඇත.

- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ අතිකාල දීමනා-සැළසුම් නොකල රියදුරු හා කොන්දොස්තර, බස් ලියාපදිංචි හා ආදායම් බලපත් ගාස්තු සහ පෞද්ගලික ආරක්ෂක වියදම් සියයට 53 කින්, සියයට 200 කින් හා සියයට 137කින් වැඩිවී ඇත.

## 2.3 අනුපාත විශ්ලේෂණය

---------------------------

2018 වර්ෂයේ ජංගම වත්කම් අනුපාතය 1:1.66 ක් වූ අතර ඊට අනුරූපීව 2019 වර්ෂයේ ජංගම වත්කම් අනුපාතය 1:1.31 ක් විය. 2018 වර්ෂයේ ශුද්ධ ලාභ අනුපාතය සියයට 3.53 ක් වූ අතර ඊට අනුරූපීව සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභ අනුපාතය සියයට 5.29 ක් විය.ඒ අනුව පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ජංගම වත්කම් අනුපාතයේ හා ශුද්ධ ලාභ අනුපාතයේ වර්ධනයක් දක්නට විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

## 3.1 අනාර්ථික ගනුදෙනු

---------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| -------------------------- | --------------------------------- | --------------- |
| (අ) 2014 වර්ෂයේදී බස් රථ 2, 200ක් වසර 05ක ණය පදනමක් යටතේ මිලදී ගැනීමේ ගිවිසුම් ප්‍රකාරව වසර 05ක කාලය තුළදී මෙම බස් රථ සඳහා ගෙවීම් සිදුකර අවසන් කල යුතු වුවත්, 2020 මාර්තු මාසය දක්වා ගෙවීම් සිදුකර තිබුණි. එලෙස ණය කාල සීමාව ඉක්මවීම හා කාර්තුමය පදනමින් ගෙවන වාරික නිසි පරිදි නොගෙවීම හේතුවෙන් රු. 419,237,588ක පමා පොළියක් ගෙවීමට සිදුව තිබුණි. එමෙන්ම ගිවිසුම් ප්‍රකාරව ඇමරිකන් ඩොලර් මගින් බස් රථ 2, 200ක් සඳහා ඇමරිකන් ඩොලර් 72,620,000ක් ගෙවිය යුතු අතර විනිමය අනුපාතයේ අවප්‍රමාණ වීම හේතුවෙන් රු.මිලියන 1,788ක පාඩුවක් මණ්ඩලයට සිදුව තිබුණි. මේ අනුව රු.මිලියන 2, 207ක පාඩුවක් මෙම ගිවිසුම මගින් මණ්ඩලයට සිදුවී තිබූ අතර, එය බස් රථයකට සාමාන්‍ය පාඩුව රු.මිලියන 1ක පමණ අගයක් විය. | මෙම බස්රථ 2200 ට අදාල වාරික ගෙවීම සඳහා ඩිපෝවන් විසින් දෛනිකව මුදල් ප්‍රධාන කාර්යාලය වෙත බැර කළ යුතු වුවත් එම කාල සීමාව තුළ ඩිපෝවන්හි පැවති මූල්‍ය දුෂ්කරතා නිසා අදාල මුදල් නොලැබුණු බැවින් නියමිත දිනයන්ට නියමිත පරිදි වාරික මුදල් ගෙවීම් කිරීමට නොහැකි විය. මේ හේතුවෙන් ප්‍රමාද පොළියක් ගෙවීමටද සිදු විය.<br>තවද මෙම ගිවිසුම ඇමරිකානු ඩොලර් මඟින් ගෙවීම් කළ යුතු ආකාරයට එළඹීම නිසා රුපියල අවප්‍රමාණය වීම මත රුපියල් මිලියන 1,784 ක් වැනි විනිමය අලාභ ගෙවීමට සිදුවිය. | ගිවිසුම් ප්‍රකාරව ගෙවීම් කළයුතු වේ. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ)මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාල ,ඩිපෝ ,රියදුරු පුහුණු පාසල් හා ප්‍රාදේශීය වැඩපොළ පිහිටි ඉඩම් පිළිබඳව මණ්ඩලය යාවත්කාලීන ලිපිගොනු පවත්වා ගැනීම හෝ ඉඩම් පිළිබඳ ලේඛනයක් නඩත්තු කිරීම සිදු කර නොතිබුණි. තවද, මණ්ඩලය සතු සියලු ඉඩම් හඳුනාගැනීම හා අයිතිය නිරවුල් කර ඉඩම් වටිනාකම තක්සේරු කිරීමට විගණිත දින වන විට කටයුතු කර නොතිබුණි. | • ශ්‍රී ලං.ග.ම. ඉඩම් පිළිබඳ යාවත්කාලීන කරන ලද ඉඩම් ලේඛනයක් පිළියෙල කර ඇති අතර, ශ්‍රී ලං.ග.ම. භාරයේ ඇති සහ හිමිකම පවතින ඉඩම් සම්බන්ධ තොරතුරු ගොනු කර, ලිපි ගොනු විධිමත් කර ඇත.<br>• ඉඩම් කටයුතු සම්බන්ධයෙන් ප්‍රාදේශීක වලට අදාළව කමිටු 12 ක් පිහිටුවා ඇති අතර, එහි කමිටු මඟින් සියලුම දත්ත එක්රැස් කර ප්‍රාදේශීක වශයෙන් ලිපිගොනු සකස් කරමින් පවතී. දැනට ප්‍රාදේශීය මට්ටමින් චක්‍රලේඛනයක් මත සකස් කර ඇති ඉඩම් කමිටු 12 මඟින් ශ්‍රී ලං.ග.ම. භාරයේ පවතින සියලුම ඉඩම් සම්බන්ධයෙන් ඉඩම් හඳුනා ගැනීම, ඉඩම් පිළිබඳ අයිතිය නිරවුල් කර ගැනීම, ඉඩම් සඳහා පැවරුම් ඔප්පු සකස් කර ගැනීම සඳහා මූලික ක්‍රියාවලිය ආරම්භ කිරීම, ඉඩම් පිළිබඳ ලේඛනයක් නඩත්තු කිරීම සඳහා කටයුතු කරමින් ශ්‍රී ලං.ග.ම. ඉඩම් පිළිබඳ විධිමත් සැකැස්මක් ක්‍රියාවේ යොදවා ඇත.<br>- ශ්‍රී ලං.ග.ම. යේ ඒකල වැඩපළ පිහිටි වර්තමානයේ සී/ස ලක්දිව ඉංජිනේරු සමාගම ක්‍රියාත්මක වන අක්කර 23 රූඩ් 1 පර්චස් 16.5 ඉඩම ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ ශ්‍රී ලං.ග.ම. ය වෙත අත්කර ගැනීම සම්පූර්ණ කර ඇත. මෙම ඉඩම සඳහා නිදහස් දීමනා පත්‍රයක් ලබාගෙන ඇත.<br>- 1957 අංක 48 දරන මෝටර් ගමනාගමන පනතට අනුව බස් සමාගම් ජනසතු කිරීමේදී ශ්‍රී ලං.ග.ම. යට ගැසට් නිවේදන මඟින් පැවරී ඇති ඉඩම් හා දේපළවල හිමිකම් තහවුරු කරගැනීම සඳහා ගරු ප්‍රවාහන අමාත්‍යතුමා සහ ඉඩම් | ලේඛන නිසි පරිදි නඩත්තු කළයුතු වේ. |

| | | |
|---|---|---|
| | අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කිරීමට සකසන ලද ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශ කෙටුම්පත අදාළ ඇමුණුම් සහිතව වාහන නියාමනය, බස්රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කාර්මාන්ත රාජ්‍ය අමාත්‍යශයට ලබාදී ඇත.<br>ශ්‍රී ලං.ග.ම. විසින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් මිලදි ගැනීමේ පදනම මත භුක්තිය භාරගෙන ඇති ඉඩම් සඳහා එම කොමිෂන් සභාවෙන් පැවරුම් ඔප්පු ලබාගැනීමට කටයුතු කර ඇත. ඒ අනුව දැනටමත් ශ්‍රී ලං.ග.ම. මතුගම ඩිපෝවට හා හක්මන ඩිපෝව පිහිටි ඉඩම් සඳහා පැවරුම් ඔප්පු ලබාගෙන ඇත. | |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------------

| විගණන නිරීක්ෂණය<br>----------------------- | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>------------------------------------- | නිර්දේශය<br>-------------- |
|---|---|---|
| (අ)මැදවච්චිය ප්‍රාදේශීය වැඩපොලෙහි ධාරිතාවය හා පෙර පරීක්ෂණ වාර්තා අනුව මසකට එංජින් 60 ක් පමණ අළුත්වැඩියා කල හැකි වුවත්, සමාලෝචිත වර්ෂය වන විට මසකට එංජින් 15 ක් පමණක් අළුත්වැඩියා කරන බව නිරීක්ෂණය වූ අතර, එය මුළු ධාරිතාවයෙන් සියයට 2 5ක ප්‍රමාණයක් වූ අතර ඌන උපයෝජනය සියයට 75 ක් වී තිබුණි. | සේවක හිගකම නිසා එන්ජින් අළුත්වැඩියා හා බස් බොඩි ගැසීමේ ධාරිතාව පහල යාමට බලපෑ ඇත. සාමාන්‍යයෙන් එක් බස් බොඩියක් අළුත්වැඩියා කිරීමට දින 20 ක් පමණ ගත වේ. | උපරිම ධාරිතාවයෙන් කටයුතු සිදුකළ යුතුය. |
| (ආ)ඩිපෝ 23 කට අදාළව සිදුකරන ලද නියැදි පරීක්ෂාවේදී බස් රථ 167 ක පමණක් මයිලෝමීටර ක්‍රියාත්මකව තිබුණු අතර, බස් රථ 846 ක මයිලෝමීටර් ක්‍රියාත්මකව නොපැවතුණි. | i.සෑම බස් රථයකටම ඩිජිටල් මයිලෝ මීටර් සවිකර ඇති අතර, ඒවා අකර්මන්‍ය වූ විගස සකසා භාවිතයට ගත නොහැක. එබැවින් නව මයිලෝ මීටර් සවිකල යුතුය. එවිට අධික පිරිවැයක් දැරීමට සිදුවේ. එම පිරිවැය ගැන සලකා මයිලෝ මීටර් සවිකිරිම සිදුකර නොමැත.<br>ii.එමඟින් බස්රථ වල සේවා කිරිම් තෙල් මාරුකිරිම් නිවැරදි | මයිලෝ මීටර් ක්‍රියාකාරී තත්වයට පත් කළයුතුවේ. |

| | | |
|---|---|---|
| | කිලෝමීටර් ගණනට සිදුකිරිම නොහැකි බව පෙන්වා දී ඇති නමුත් මයිලෝ මීටරය නොමැති වීම එයට බලපා ඇති ප්‍රධාන සාධකය නොවේ. සේවක පුරප්පාඩුව හා එම බස්රථ වලට යෙදිය යුතු තෙල් වර්ග මාදිලියෙන් මාදිලිය වෙනස් වේ. | |

## 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

----------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)මණ්ඩලය සතුව 2020 වර්ෂය අවසාන වන විට බස්රථ 1,037 ක් ධාවනයෙන් බැහැරව තිබුණි. | 2015 වර්ෂයේ පැවති බස්රථ ඇණිය 2020 වර්ෂය වන විට අඩුවීමට පහත කරුණු බලපා ඇත.<br>i. බස්රථ ඇණියේ බස්රථ වසරක් පසා ක්‍ෂය විමට ලක්වන අතර, එමගින් බස්රථ ඇණිය අඩුවීමට හේතු වී ඇත.<br>ii. ඵලදායි නොවන බස්රථ ගර්හිත කර රථ ඇණියේ ඉවත් කිරීම නිසා බස්රථ ඇණිය අඩුවීමට බලපා ඇත.<br>iii. නියම අමතර කොටස් ශ්‍රී ලංකාව තුල නිෂ්පාදන ආයතන නොමැති නිසා අමතර කොටස් නිෂ්පාදිත විදේශ රට වලින් ආනයනය කර ලබාගැනීමට කාලයක් ගතවේ. එම නිසා අළුත්වැඩියා කටයුතු ප්‍රමාද විම හේතුවෙන් ධාවනයට ලබාදෙන බස්රථ ප්‍රමාණය ක්‍රම ක්‍රමයෙන් අඩුවිමට බලපා ඇත.<br>iv. අව්‍යාජ අමතර කොටස් වෙනුවට නියෝජිත ආයතන මගින් ලබාදෙන අමතර කොටස් බස්රථ වලට යොදා ධාවනයට එක් කිරිමෙන් අකාලයේ එන්ජින් අකර්මන්‍ය වි ධාවන බස්රථ ඇණිය පහත වැටිමට හේතු පාදක වි ඇත.<br>v. අවුරුදු 15ට වැඩි බස්රථ සඳහා අමතර කොටස් හා කට්ටල් උපකට්ටල් නිෂ්පාදිත රටේවත් නොමැතිකම නිසා ඒවා ගර්හිත කර රථ ඇණියෙන් ඉවත් කිරීමට සිදුවිම හේතුවෙන් ධාවන බස්රථ අඩුවීමට එයද බලපා ඇති ප්‍රධාන සධකයකි.<br>vi. බරපතල අනතුරු නිසා බස්රථ සුළු ප්‍රමාණයක් රථ ඇණියේ වාර්ෂිකව ඉවත්වේ. (ඒවා අළුත්වැඩියා කරගත නොහැකි තත්වයේ ඒවා විම) | ධාවනයෙන් ඉවත් කළ බස්රථ අලුත්වැඩියා කර ධාවනයට එක් කිරීම සහ එසේ කළ නොහැකි බස්රථ විකිණීමට කටයුතු කළයුතු වේ. |
| (ආ)බස් රථ වලට යොදන පෙරසවි ටයරයක් කි.මී. 15,000 ක පමණ දුර ප්‍රමාණයක්ද ,නැවත | පෙරසවි ටයර් හා නැවත පිරවු ටයර් අවස්ථා 34 කදි නැවත ගලවා ඉවත් කිරිමට පහත සඳහන් කරුණු බලපා ඇත.<br>i. සුමට මාර්ගයන් වල ගමන් කිරිමේදි නියමිත | ටයර් නියමිත ප්‍රමිතියෙන් පෙරසවි හා නැවත පිරවීම් කටයුතු කළයුතු |

| | | |
|---|---|---|
| පිරවූ ටයරයක් කි.මී. 11,000 ක පමණ දුර ප්‍රමාණයක්ද ,ධාවනය කල යුතු බවට නිශ්චය කර තිබුණද ,නැවත පිරවූ ටයර් ගලවා ඉවත් කරන ලද අවස්ථා 34ක් වූ අතර,ඒවා ධාවනය කර තිබූ සාමාන්‍ය කිලෝමීටර් ගණන වුයේ 7, 402ක් පමණි .මේ අනුව පෙරසවි හා නැවත පිරවූ ටයර් වලින් ධාවනය කල යුතු සම්මත දුර ප්‍රමාණය ධාවනය කිරීමට අසමත් වී තිබුණි. | කාලයට ප්‍රථමයෙන් පෙර සවි හා නැවත පිරවූ ටයර් ගැලවීමක් සිදු නොවන අතර, රජ මාර්ගයන්හි ධාවන කටයුතු වල නිතර විමේදි මෙම සිදුවිම නිරන්තරයෙන් සිදුවේ. එම මාර්ගයන්හි බස් රථය ධාවනයෙන් ඉවත් කිරිමට නොහැක. මන්ද යත් එම ග්‍රාමීය මාර්ගයන්හි ජනයාගේ සුභ සාධනය උදෙසා එම බස්රථ එම මාර්ග වල ධාවනය කිරිමට කටයුතු කර ඇත. එබැවින් මෙම ගැටළුව මුහුණ දිමට සිදුවි ඇති බව පෙන්වා දිය හැක.<br>ii. බැවුම් හා වංගු සහිත මාර්ගයන්හි ධාවනය කරවිමේදි මෙම ගැටළුව සිදුවන බව පෙන්වා දි ඇත. එමෙන්ම එම බස්රථ ධාවනයෙන් ඉවත්කලහොත් මාර්ගයේ මගි පරිභෝජනය ලබාගන්නා ජනතාවට එමගින් විශාල ගැටළුවකට මුහුණ දිමට සිදුවේ.ශ්‍රී ලං.ග.ම. සුභ සාධනය අරමුණු කරගෙන ධාවන කටයුතු නිරතවන අතර හුදෙක් ලාභය අරමුණු කර නොගනි.<br>iii. මෙම පෙරසවි ටයර් හි නැවත පිරවූ ටයර් මිලදි ගන්නා ආයතන වලින් නියමිත කාලයට ප්‍රථමයෙන් ටයර් ගලවා ඉවත් කිරිමට සිදුවන විට එම ආයතන දැනුම් දුන් පසු ප්‍රතිපාදන ලබාදිමටද කටයුතු කරන අතර, එම ප්‍රතිපාදන අදාල ආයතන සඳහා යොමුකර ඇත. | වේ. |
| (ඇ)සිදුකරන ලද නියැදි විගණනයේදී නැගෙනහිර පළාතේ ඩිපෝ 2 ක දැනට වසර ගණනකට පෙර මිලට ගන්නා ලද රු.3,854,529 ක නිකුත් නොවන බස් රථ අමතර කොටස් 424 ක ප්‍රමාණයක් ප්‍රයෝජනයට ගැනීමට නොහැකිව ගබඩා තුළ තිබුණි. | වසර ගණනාවකට පෙර බණ්ඩාරවෙළ වැඩපලින් සහ වේරහැර වැඩපලින් ලද ලේලන්ඩ් ඉසුසු අමතර කොටස් බවත් දැන් එම බස්රථ භාවිතයෙන් ඉවත් කර ඇති බවත්ය. එම නිසා, එම අමතර කොටස් නිකුත් නොවී පවතින බව හඳුනා ගන්නා ලදී. එමෙන්ම කල්මුණ ඩිපෝවෙන් නිකුත් නොවන බස්රථ අමතර කොටස් ඩිපෝවේ ඇති බවත් එම අමතර කොටස් වසර ගණනාවකට පෙර ප්‍රධාන කාර්යාලයෙන් ලබා දුන් ඉසුසු සහ ටාටා බස් රථ අමතර කොටස් බවත්, දැනට එම බස්රථ භාවිතයෙන් ඉවත් කර ඇත. ඇතැම් ටාටා බස්රථ වෙනත් ඩිපෝවන් විසින් රැගෙන ගොස් ඇති බවද, වැඩි දුරටත් ඔහු පවසන ලදි. | ශ්‍රී ලංගම වෙත ඇති පාවිච්චියට ගත නොහැකි අමතර කොටස් බාහිර පාර්ශවයන්ට විකිණීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ)අක්කර 26කින් යුක්ත මැදවච්චිය ප්‍රාදේශීය වැඩපොල පිහිටි ඉඩමෙහි අක්කර 5ක ප්‍රමාණයක් විධිමත් අනුමැතියකින් තොරව තෙවන පාර්ශවයක් වෙත ලබාදී තිබුණි . තවද මෙම ඉඩමෙන් | වර්තමානය වන විට සේවක හිඟය මත මෙම ප්‍රාදේශිය වැඩපලෙහි කටයුතු අතරමග නතර වී ඇත. ඉඩමේ පවතින අයිතිය පිළිබඳ කටයුතු ශ්‍රී ලං.ග.ම. ලේකම් හරහා කටයුතු සිදු කරමින් පවතින අතර ඉදිරියේදී මෙම ඉඩම ඵලදායි අයුරින් යොදා ගැනීමට කටයුතු කරමි. | ඉඩමේ අයිතිය පවරාගෙන ඵලදායීව යොදාගැනීමට කටයුතු කළයුතුය. |

| | | |
|---|---|---|
| අක්කර 20.7ක ප්‍රමාණයක් ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි .එසේම අක්කර 1.25ක භූමි ප්‍රදේශයක ඉදිකරන ලද වැඩපලක් කිසිදු ප්‍රයෝජනයට නොගෙන දිරාපත් වෙමින් පැවතුණි. | | |
| (ඉ)කුරුණෑගල ප්‍රාදේශිය වැඩපලෙහි එංජින් අළුත්වැඩියා කිරීම සඳහා 2017ජුනි 03දින මිල ගණන් කැඳවීම් සිදු කර රු. 12,737,394 ක් වටිනා මෙවලම් හා යන්ත්‍රෝපකරණ 9ක් මිලදී ගෙන ප්‍රාදේශිය වැඩපල වෙත ලබාදී තිබුණි .එම යන්ත්‍ර හා උපකරණවලින් රු 3,661,430.ක් වටිනා Cylinder block head surface grinding machine යන්ත්‍රය පමණක් අළුත්වැඩියා කටයුතු සඳහා යොදා ගන්නා බව නිරීක්ෂණය වූ අතර ,රු 9,075,963.ක් වටිනා අනෙකුත් යන්ත්‍රෝපකරණ පරීක්ෂාවේදී ඒවා භාවිතයට ගෙන නොතිබුණි. | නව යන්ත්‍රෝපකරණ අංගණයේ සේවය කිරිමට යාන්ත්‍රික ශිල්පින්ගේ පුරප්පාඩු පවති. මේ පිළිබඳව ශ්‍රී ලං.ග.ම. ප්‍රධාන කාර්යාලයට දැනුවත් කල අතර ඒ අනුව දෛනික පදනම යටතේ යාන්ත්‍රික ශිල්පී මහතකු 2020.07.22 වෙනි දින සේවයට පැමිණි අතර, 2020.08.06 වෙනි දින සිට මේ වන තෙක් සේවයට වාර්තා කර නොමැත. එ බැවින් මේ සම්බන්ධව දැණුවත් විම් කලද පුරප්පාඩු පිරවිමට සේවක මහතුන් ලබා දිමක් සිදු නොවිණ.<br>2020.12.03 වෙනි දින ශ්‍රී ලං.ග.ම. නි.සා කාර්මික තැනගේ අනුමැතිය ඇතිව සම්පාදක අංශය වෙත ඇණවුම් පත් භාරදී ඇත .නිෂ්පාදන කටයුතු අඩාලවීම වලක්වාලීම සඳහා මැදවච්චිය සහ උඩුබද්ධාව වැඩපලවල් මගින් 8 x 4 G18 ඇළුම්ණියම් තහඩු ලබා ගන්නා ලදි. 2021.01.05 වෙනි දින නැවත ඇණවුම්පත් ශ්‍රී ලං.ග.ම. වෙත භාරදීමෙන් පසු 2021.01.22 වෙනි දින ඉහත වර්ගයේ ඇළුම්ණියම් තහඩු 75 ක් කුරුණෑගල ප්‍රාදේශිය වැඩපල වෙත ගෙන එන ලදි.<br>2020 දෙසැම්බර් මස මිල ඇණවුම්පත් සහ ER 49 පිටපත් ශ්‍රී ලං.ග.ම. ප්‍රධාන කාර්යාලය මගින් අනුමැතිය ලබාදුන් අතර, නියමිත දිනයන්ට අදාල භාණ්ඩයන් ටෙන්ඩර් අනුමත ලද ආයතන වල අවශ්‍ය ප්‍රමාණ නොමැති හෙයින් අවශ්‍ය ප්‍රමාණයට භාණ්ඩ ලබා ගැනිමට ප්‍රමාදයක් සිදුවි ඇත. නැවත 2021.03.08 වෙනි දින වන විට යුරෝ පිස්ටන් සිලිව් සෙට් 10ක් කුරුණෑගල ප්‍රාදේශිය වැඩපල වෙත ලබා දෙන ලදි.<br>2020.11.25 දින ප්‍රමිතියෙන් තොර දහර කඳන් 05 ආපසු එම ආයතනය භාර ගෙන ප්‍රමිතියෙන් යුත් දහර කඳන් 05ක් එදිනම අප ආයතනයට නැවත දෙන ලදි.<br>2020/11/18 දින වන විට අවශ්‍ය තිනර් නොලැබුණු අතර මිල කැඳවිම් පත් මගින් නි/සා/කාර්මික තැනගේ අනුමැතිය ඵගෙන 2021/03/03 දින තිනර් ලිටර් 40ක් මිලදී ගෙන | වත්කම් ඵලදායීව ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළයුතුවේ. |

| | | |
|---|---|---|
| | ඇත.<br>ශ්‍රී ලං.ග.ම. ප්‍රධාන කාර්යාලයේ සිවිල් ඉංජිනේරු කොට්ඨාශය වෙත මේ පිළිබඳ ලිපි සහ දුරකථන ඇමතුම් මගින් කීප වාතාවක්ම දැණුවත් කලද මේ වන තෙක් කිසිදු අලුත්වැඩියාවක් කර නැත. මේ සඳහා සිවිල් ඇස්තමේන්තුද සදා තිබිණි.<br>අවශ්‍ය අබලි ද්‍රව්‍ය ගබඩාවේ දැමිය යුතු බැවින් ගබඩාවේ ස්ථාන ගත කර ඇති (අබලි පිස්ටන්, අබලි බ්‍රාස්කොන්) දැනට ප්‍රධාන ගබඩාවේ ඇති ලී රාක්ක සියල්ලම භාවිතයට ගත නොහැකි ආකාරයෙන් දිරිපත්ව ඇත. මේ අනුව ඵලදායිතායව සම්බන්ධ S5 (එස් පහ) සංකල්පය ක්‍රියාත්මක කිරිමට ප්‍රමාද වී ඇත.<br>ප්‍රධාන ගේට්ටුව සඳහා යකඩ සපයා දිම හා සකස්කර දිම මාර්ග සංවර්ධන අධිකාරියේ ඉටුකර ගැනිමට ඇති හැකියාව හා උත්සහයක් ගනු ලැබිය. නමුත් ඒ සඳහා ඉඩ ප්‍රස්ථාවක් නොලැබිණ.<br>ශ්‍රී ලං.ග.ම. ප්‍රධාන කාර්යාලයේ සිවිල් ඉංජිනේරු කොට්ඨාශය වෙත මේ පිළිබඳ ලිපි සහ දුරකථන ඇමතුම් මගින් කීප වාතාවක්ම දැණුවත් කලද මේ වන තෙක් කිසිදු අළුත්වැඩියාවක් කර නැත. මේ සඳහා සිවිල් ඇස්තමේන්තුද සදා තිබිණි. | |
| (ඊ)වාහන වායු විමෝචන මධ්‍යස්ථාන ඉදිකිරීම ශක්‍යතා අධ්‍යයනයකින් තොරව සිදු කර තිබුණි. කුරුණෑගල හා මැදවච්චිය යන මධ්‍යස්ථාන ඉදිකිරීම් නිමකර විවෘත කර තිබුණද, නීතිමය ගැටලුවක් නිසා වසා පැවතුනි .එම නිසා එම මධ්‍යස්ථානවල වටිනාකම රු.මි 18.75 .ක් වන යන්ත්‍ර සූත්‍ර නිෂ්කාර්යව පැවතුණ අතර විගණිත 2019 සැප්තැම්බර් 30 වන විට සිවිල් වැඩ සඳහා මණ්ඩලය රු.මි. 22.48ක් වැය කර තිබුණි. | වායු විමෝචන මධ්‍යස්ථාන ඉදිකළද දැනට මෙම දුම් සහතික ලබා දෙන ආයතන මගින් අධිකරණය වෙත කරුණු ඉදිරිපත් කිරීමක් තුළ මෙම ව්‍යාපෘතිය අතරමඟ නතර කිරීමට සිදුව ඇත. | ව්‍යාපෘති නියමිත පරිදි ක්‍රියාත්මක කළයුතු වේ. |

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කළුතර හා මතුගම ඩිපෝවල වැසිකිළි පද්ධති ඉදිකිරීම සඳහා රු 5,698,960.ක මුදලකට ඉදිකිරීම් සමාගමක් වෙත ගිවිසුම්ගතව පවරා තිබූ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් මණ්ඩලය සමාලෝචිත වර්ෂය තුළ රු 1,245,533.ක මුදලක් වියදම් දරා තිබුණි. 2021පෙබරවාරි 05 විගණිත දින වන විටද මෙම ඉදිකිරීම් කටයුතු නිමකර නොතිබුණි. තවද, ඉදිකිරීම් කටයුතු සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේදී හා ඒවා අනුමත කිරීමේදී ඊට අදාල වන අනුමත රේටයන් හා පිරිවිතර සම්බන්ධයෙන් අවධානය යොමු කර නොතිබුණි. | කළුතර සහ මතුගම වැසිකිළි පද්ධති ඉදි කිරීම් කටයුතු ප්‍රසම්පාදන තීරණ මත මෙම ආයතනය වෙත ඉදිරිපත් කර ඇත. එසේ වුවද අදාල ආයතනය මෙම කටයුතු අතරමග නතර කර දමා ඇත. මේ වන විට ඒ පිළිබඳව නීති අංශය මගින් ඉදිරි නීති කටයුතු සිදු කරමින් පවතී.වැසිකිලි පද්ධතියේ කොන්ක්‍රීට් වහලෙහි පිරිවිතරය ඉදි කිරීම් කටයුතු සඳහා සකස් කරන ලද ඇස්තමේන්තුවේ අංක 08 හි සඳහන් කර ඇත.<br>වැසිකිලි පද්ධතියේ ඉදිකිරීම් කටයුතු වලදී කොන්ක්‍රීට් වහලේ ගණකම වැඩි කර බිත්ති බැඳ ඇත්තේ එම කොන්ක්‍රීට් වහල මත ජල ටැංකි ස්ථාපිත කර ඩිපෝ පරිශ්‍රයට අඛණ්ඩ ජල සැපයීම කිරීම අරමුණු කර ගෙනය. | කොන්ත්‍රාත් කටයුතු අදාල මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතු වේ. |
| (ආ)මණ්ඩල 2018 මාර්තු 20 දින ඔරුගොඩවත්ත ඉන්ධන පිරවුම්හල ඉදිකිරීම සඳහා එළඹි රු 61,014,316.ක වටිනාකමැති ගිවිසුම ප්‍රකාරව මෙම කාර්යය 2018ජුනි 20දින නිම කළ යුතු වුවද, 2020අගෝස්තු 19දින වන විටද මෙම ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණි .මෙම ඉදිකිරීම පිළිබඳ ප්‍රසම්පාදන කටයුතු ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට බැහැරව කිරීම නිසා මණ්ඩලයට රු 2,102,126. ක මූල්‍යමය අලාභයක් සිදුවී තිබුණි .තවද කොන්ත්‍රාත්කරු ගිවිසුම් පරිදි නියමිත දිනට ඉදිකිරීම් නිම නොකිරීම නිසා මණ්ඩලයට ඉන්ධන පිරවුම්හල ක්‍රියාත්මක වීමෙන් ලබාගත හැකිව තිබූ ආදායම් අහිමි වී තිබුණි .එසේම රු 12,610,500.ක් වටිනා ඩීසල් හා පෙට්‍රල් පොම්ප 07ක් එම භූමියේ කිසිඳු ආරක්ෂිත පියවරකින් තොරව තිබුණු අතර තැන්පත් කර තිබූ ඉන්ධන ටැංකිවල පියන් කොන්ත්‍රාත්කරු විසින් ඉවත් කර ගෙන ගොස් තිබුණි. | ශ්‍රී ලං.ග.ම. මහ පරිමාන ප්‍රසම්පාදන මණ්ඩලය විසින් 2018/02/26 වන දින පැවති 04 වන ප්‍රසම්පාදන රැස්වීමේදී ඔරුගොඩවත්ත ඉන්ධන පිරවුම්හල ඉදි කිරීම සඳහා රු.61,014,316 ක මුදලකට ඔරුගොඩවත්ත ඉන්ධන පිරවුම් හල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව පිරිනැමීමට අනුමැතිය ලබා දී ඇත.ඒ සඳහා 2018/02/14 වන දින ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා ලේකම් තැන විසින් අනුමැතිය ලබා දී ඇත.ලාෆ් ඉංජිනියරින් සමාගම වෙත ප්‍රසම්පාදන කටයුත්ත පිරිනැමීමේදී ඒ සඳහා සමෝදා කන්ස්ට්‍රක්ෂන් පුද්ගලික සමාගමට වඩා රු.2,102,126/- ක වැඩි වටිනාකමට පිරිනැමීමට කටයුතු සිදුවී ඇත.<br>ලාෆ් ඉංජිනියරින් සමාගම ඉදිකිරීම් කාර්ය විධිමත්ව සිදු නොකිරීම පිළිබඳව වරින් වර දැනුවත් කිරීම් කල අතර ශ්‍රී ලං.ග.ම. නීති අංශය දැනුවත් කර උපදෙස් ලබා ගෙන කාර්ය සාධන ඇපකරය (රු.3,105,100/-) 2020/06/11 දින ශ්‍රී ලං.ග.ම. වෙත | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව කටයුතු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| | බැර කර ගැනීමට කටයුතු කර ඇත.පසුව එම හේතුව නිසා මෙම ආයතනයේ තෙල් ටැංකි වල පියන් රැගෙන යාම නිසා ඒ පිළිබඳව ගෲන්ඩ් පාස් පොලීසිය වෙත ශ්‍රී ලං.ග.ම. විසින් පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත. දැනට ශ්‍රී ලං.ග.ම. ආරක්‍ෂක නිළධාරීන් විසින් පැය 24 පුරා ආරක්‍ෂාව ලබා දී ඇත. | |
| (ඇ)උඩහමුල්ල රියදුරු අභ්‍යාස විද්‍යාලයේ දේශන ශාලාවක් ඉදිකිරීම සඳහා 2018වර්ෂයේදී රු . 2,749,740 ක වටිනාකමකට ගිවිසුම්ගතවී රු 824,922 ක අත්තිකාරම් මුදලක්ද තවත් රු . 108,767ක මුදලක් ගෙවා තිබුණද ඉදිකිරීම් වැඩ අතරමඟ නවතා නිෂ්කාර්යව තිබුණි. | මෙම බිල්පතට ගෙවීම් කිරීමේදී ගෙවූ අත්තිකාරම් මුදලින් කොටසක් අඩු කර ගෙවීම් කර ඇත. 2019 ජනවාරි මස දෙවන බිල්පත් ලෙස රු.658,217.80ක මුදලක් ඉදිරිපත් කලද එම බිල්පතට ගෙවීම් සිදු නොකරන ලදී. | ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

------------------------------------------------

**4.1 පාරිසරික ගැටලු**

--------------------

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ)ඩිපෝ පරිශ්‍රයන්හි ඇති අංගනවල තෙල් අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා පිළිගත් අනුමත ක්‍රමවේදයක් භාවිතා කළ යුතු අතර 2008 ,ජනවාරි 25 දිනැති හා අංක 16/1533 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් හා 1980අංක 47දරන ජාතික පාරිසරික පනතට අනුව ඒ සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් බලපත්‍රයක් ලබාගත යුතු වුවත් ,මණ්ඩලයේ ඩිපෝ 107න් ඩිපෝ 11 ක් හැර අනෙකුත් ඩිපෝ එම පරිසර බලපත්‍රය ලබාගෙන නොතිබුණි . | ආයතනය තුළ ක්‍රියාත්මක ඵලදායිතා සංකල්ප වැඩසටහන යටතේ ඩිපෝවන් 24 ක් සඳහා බලපත්‍ර ලබා ගෙන ඇති අතර තවත් ඩිපෝවන් 11 ක් සඳහා මේ වන විට බලපත්‍ර ඉල්ලුම් කර ඇත. | ගැසට් පත්‍රය හා 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතට අනුකූලව කටයුතු කළ යුතුවේ. |